දුරකථන ) 0112669192 ,0112675011
தொலைபேசி 0112698507 , 0112694033
Telephone ) 0112675449 ,0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம்

මගේ අංකය )
எனது இல )
My No. )CF/EXV/06/2021

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2021/ 08/ 03
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதாரம் அமைச்சு
Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02 - 70/2021

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

රේඛීය අමාත්‍යාංශ යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල ආයතන ප්‍රධානින් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ( MT - 05 ) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයට අදාළ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ 11 "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2021**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ 11 "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරීන් II "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගතවීමට පෙර සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන දිනය, ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ හැක්කේ 2021/08/28 දින වනවිට මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ / II "අ" ඛණ්ඩයට / 11 ශ්‍රේණියට පත්වීම් ලද මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකරන ලද නිලධාරීන්ට පමණි.

**සැ.යු :- 2021/08/28 දින වන විට 11 "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියට පත්කර අදාල පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.**

**03. අයදුම්පත් -**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරු විසින් සකස්කර ගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (විභාග) වෙත **2021/08/28** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.45.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවර 03ක් ද එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ.යු. :- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාග ගාස්තු -

I. විභාගයට පළමුවරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු.. 25/- බැගින් අවලංගු නොකල මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ

05. විභාගයට ඇතුලත් කර ගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ ඊට අදාල ආයතනයන් මගින් විධිමත් ලෙස නිකුත් කරනු ලබන හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. විභාග පරිපාටිය : -

මෙම විභාගය **දෙපාර්තමේන්තු පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** යනුවෙන් කොටස් දෙකකි. දෙපාර්තමේන්තු පරීක්ෂණය, ලිඛිත, වාචික සහ ප්‍රායෝගික වශයෙන් කොටස් තුනකින් යුක්ත වන අතර, එක් එක් කොටස සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම කොටසකට අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

**කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති** යනුවෙන් සහ **මුදල් රෙගුලාසි** ලෙස විෂයන් දෙකකින් සමන්විත වන අතර විෂයන් දෙකටම ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

එක්වරකදී හෝ කිහිපවරකදී විෂයන් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළයුතුය.

07. විෂය නිර්දේශ මාලාව

07.1 දෙපාර්තමේන්තු පරීක්ෂණය

07.1.1 විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය තුනකි. රචනා මාදිලියේ ප්‍රශ්න අටකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි. මුළු ලකුණු 100කි. සමත්වීම සඳහා 40% ලකුණු ලබාගත යුතුය.

**විෂය නිර්දේශය**

i. සමාන්‍ය පරිපාලනය
ii. රක්තවේදය
iii. ක්ෂුද්‍ර ජීව විද්‍යාව
iv. අධ්‍යාපන විද්‍යාව
v. පරපෝෂිත වේදය
vi. වෛද්‍ය කීට විද්‍යාව
vii. ආහාර සුරක්ෂිතතාව හා ස්වස්ථතාවය
viii. මානසික සෞඛ්‍ය
ix. පරිසර සෞඛ්‍ය
x. ගොඩනැගිලි නිර්මාණය
xi. බෝවන රෝග හා වසංගතවේදීය ආවේක්ෂණය
xii. බෝ නොවන රෝග
xiii. පවුල් සෞඛ්‍ය
xiv. පාසල් සෞඛ්‍ය
xv. සෞඛ්‍ය අධ්‍යාපනය හා ප්‍රවර්ධනය
xvi සෞඛ්‍ය සැලසුම් හා කළමණාකරණය
xvii. මහජන සෞඛ්‍ය නීතිය
xviii. ජාතික සෞඛ්‍ය තොරතුරු පද්ධතිය
xix. ප්‍රථමාධාර

**07.1.2 විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය** - විෂය ක්ෂේත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණයකි. මුළු ලකුණු 100 කි. සමත්වීම සඳහා 40% ලකුණු ලබාගත යුතුය. කාලය පරීක්ෂණය අනුව තීරණය වේ.

i. පාසල් සෞඛ්‍ය
ii. මහජන සෞඛ්‍ය නීතිය
iii. කාර්යාල පරිපාටිය
iv. වසංගතවේදීය ආවේක්ෂණ ක්‍රියාවලිය

**07.1.3 විෂයානුබද්ධ වාචික පරීක්ෂණය** - විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රයට අදාල විෂය ක්ෂේත්‍රය ඇසුරින් සහ රාජකාරියේදී මුහුණපාන ගැටලු පිළිබඳව වාචිකව කරනු ලබන පරීක්ෂණයකි. කාලය විනාඩි 15 කි. මුළු ලකුණු 100කි.සමත්වීම සඳහා 40% ලකුණු ලබාගත යුතුය.

**07.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**07.2.1 ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ප්‍රශ්න පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය දෙකකි. රචනා මාදිලියේ ප්‍රශ්න හතකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුයි. මුළු ලකුණු 100කි. සමත්වීම සඳහා 40% ලකුණු ලබාගත යුතුය.

**ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.**

***ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද :-**

XV වන පරිච්ඡේදය - අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම.
XVI වන පරිච්ඡේදය - නිවාඩු ගමන්
XXIII වන පරිච්ඡේදය - ඇතැම් වර්ග වල රෝගවලින් පෙලෙන රජයේ නිලධාරියන්ට විශේෂ අනුග්‍රහය හා ඒ පිළිබඳ කොන්දේසි
XXIV වන පරිච්ඡේදය - වැටුප් ණය සහ අත්තිකාරම්
XXV වන පරිච්ඡේදය - වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහය.
XXVII වන පරිච්ඡේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග.
XXVIII වන පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි සහ විධි.
XXX වන පරිච්ඡේදය - රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව ආණ්ඩුව සතු බලතල.
XXXIII වන පරිච්ඡේදය - නීති උපදෙස් සහ නීති ක්‍රියාමාර්ග.
XLVII වන පරිච්ඡේද - සාමාන්‍ය හැසිරීම සහ විනය
XLVIII වන පරිච්ඡේදය - විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති.

***රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති**

07.2.2 මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය දෙකකි. රචනා මාදිලියේ ප්‍රශ්න හතකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු ලිවිය යුතුයි. මුළු ලකුණු 100කි. සමත්වීම සඳහා 40% ලකුණු ලබාගත යුතුය.

**මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද.**

VI වන පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිමය සහ බැංකු ගිණුම්, රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව, බැංකු ගිණුම්.
(මුදල් රෙගුලාසි 315 සිට මුදල් රෙගුලාසි 396 දක්වා)

XIII වන පරිච්ඡේදය - සැපයීම් වැඩ සහ සේවා :- සැපයීම්/මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම,
(මුදල් රෙගුලාසි 708 සිට මුදල් රෙගුලාසි 775 දක්වා)

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඩුවම් ලැබීමට යටත් වනු ඇත.

**09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න මෙම තොරතුරු [www.health.gov.lk](http://www.health.gov.lk) වෙබ් අඩවියේද ඇතුළත් කර ඇත.**

**සැ.යු. මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

EXV

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යංශයේ ( MT - 05 ) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයට අදාල මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ II "අ" බණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2021**

01. (අ) I. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) - ..........................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

III. මුලකුරු සමඟ නම (සිංහලෙන්)- ..........................................

..........................................

IV. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) I. තනතුර - ..........................................

II. "අ" බණ්ඩයට / II ශ්‍රේණියට උසස් කල දිනය -.......................... ලිපි අංකය ..........................

III. දැනට ලබන වාර්ෂික වැටුප - ..........................................

IV. ජාතික හැඳුනුම්පත් අංකය -

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

V. ජංගම දුරකථන අංකය -

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

02. ඔබ මෙවර පෙනිසිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුල ( √) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

| | | | |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | ☐ | විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය | ☐ |
| ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටි රීති | ☐ | විෂයානුබද්ධ වාචික පරීක්ෂණය | ☐ |
| මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය | ☐ | | |

03. (අ) දැනට සේවය කරන ආයතනය :– සිංහලෙන්..........................................

ඉංග්‍රීසියෙන් ..........................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ :– රේඛීය අමාත්‍යංශයට ☐ පළාත් සභාවට ☐

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත :– ..........................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය - ..........................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"×4" ප්‍රමාණයේ රු 45.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 03ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද ? ..........................................

(ඊ )1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) - ..........................................

..........................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..........................................

..........................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - ..........................................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ...................................................................................................... **EXV**

(ආ) ආයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වතාවට නොවේනම් මුද්දර අලවා තිබේද?

| මුද්දර කොටුව |
| --- |

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම ආයදුම්පත්‍රයේ සඳහන්කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු.....................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම ආයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

දිනය .............................................. ..........................................
අයදුම්කරුගේ අත්සන

07. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ සහතිකය**

මෙම අයදුම්පත භාරගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය :-............................................................. ..........................................
නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

..................................................................................... මයා/මිය/මෙනෙවිය* ...............................................නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට / නොවන* බවටද රු.............ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවද / මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොණුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි. මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

දිනය :- ..................................... .................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

09. **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

...................................................... මයා/මිය/මෙනවිය, මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ II "අ" ඛණ්ඩයේ / 11 ශ්‍රේණිය මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරියකු/ නිලධාරිණියක වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ......................... ..........................................
විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

(* අනවශ්‍ය කොටස් කපා හරින්න.)